# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2107/7 - 2019 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා - 2019.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 02**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2047/43 හා 2017.11.30 දිනැති, *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත, අංක 1869/4 හා 2014.06.30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇත.

**1.7 ඡේදයේ 7.3.2.1 කොටස පහත පරිදි සංශෝධනය විය යුතුය :**

**7.3.2.1 අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/ අංක ගණිතය/ ශුද්ධ ගණිතය/ මූලික ගණිතය/ වාණිජ අංක ගණිතය ඇතුලුව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

**7 ඡේදයේ 7.3.3.1 කොටස පහත පරිදි සංශෝධනය විය යුතුය :**

**7.3.3.1 ලිඛිත විභාගය**

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| භාෂා හැකියාව හා කළමනාකරණ සහකාර සේවා යෝග්‍යතා පරීක්ෂණය | 100 | 40 |
| අභියෝග්‍යතාවය | 100 | 40 |

එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40% බැගින් ලබා ගනිමින් විභාගයේ මුළු ලකුණු ගණනින් 50% ක් එනම්, ලකුණු 100 ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් එමෙන්ම බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙල හා පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුවම පත් කිරීම් කරනු ලැබේ.

(ඇමුණුම 03)

1A - PG 4365 — 18 (2019/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. ඇමුණුම 06 යටතේ අංක 02, අංක 04 හා අංක 05 කොටස්වල 'විභාගය' යන්න වෙනුවට 'කාර්යක්ෂමතා කඩඉම් විභාගය' ලෙස ආදේශ විය යුතුය

3. ඇමුණුම 06 සඳහා අවසානයට අංක 06 ලෙස පහත කරුණු එක් කරනු ලැබේ.

06. මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු දැනුවත් වී සිටිය යුතු මූලික සිද්ධාන්ත අඩංගු දින 10 කින් යුත් පහත පාඨමාලාව *I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ඇතුළත* සාර්ථකව හදාරා නිම කිරීම මත I ශ්‍රේණියේ නිලධාරීන්ට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

i. පාඨමාලාව පවත්වන බලධරයා : මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් හා ඒකාබද්ධසේවා අධ්‍යක්ෂ ජනරාල්

ii. පාඨමාලාව පවත්වනු ලබන කාලසීමාව : I ශ්‍රේණියට නියමිත පුහුණු පාඨමාලාවට අදාළව ඉල්ලුම්පත් කැඳවීම සඳහා වූ නිවේදනය සෑම වර්ෂයකම මුල් කාර්තුවේ දී ප්‍රසිද්ධියට පත්කරනු ලබන අතර ඒ සඳහා ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රමාණය සලකා බැලීමෙන් අනතුරුව වර්ෂයකට පවත්වන වාර ගණන තීරණය කරනු ලබයි.

iii. පාඨමාලාවේ විෂය නිර්දේශය

| *මොඩියුලය* | *කාලය* |
|---|---|
| රාජ්‍ය සේවයේ විනය ක්‍රියා පටිපාටිය | දින 02 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා වත්කම් කළමනාකරණය | දින 03 |
| සංවිධාන එලදායීත්වය | දින 02 |
| ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය | දින 02 |
| තොරතුරු දැනගැනීමේ පනත හා පාරිභෝගික සත්කාරය | දින 01 |

සටහන :

01. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් හෝ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත රාජ්‍ය සේවා පුහුණු ආයතන මගින් පවත්වනු ලබන ඉහත සඳහන් පාඨමාලාවේ මොඩියුල පහම සාර්ථකව සම්පූර්ණ කිරීම මගින් පමණක් මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

02. තවද මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා ඉහත (01) කොටසින් දක්වා ඇති විභාගය සමත් වීම හෝ (06) කොටස මගින් දක්වා ඇති පාඨමාලාවේ විෂය නිර්දේශය යටතේ ඇති මොඩියුල 05 ම සාර්ථකව සම්පූර්ණ කිරීම හැර විභාගයේ විෂයයන් හා පාඨමාලාවේ විෂයයන් ඒකාබද්ධ වූ විෂයෙන් විෂයට නිදහස් කිරීමේ පදනමක් මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමක් කිසිසේත් සිදු කරනු නොලැබේ.

එල්. ඒ. සුජාතා විජේසිංහ,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 ජනවාරි මස 09 දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක. 244, කටුගස්තොට පාර,
මහනුවර.

02 - 227

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.